# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1574/25 - 2008 නොවැම්බර් 07 වැනි සිකුරාදා - 2008.11.07

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 1/69.

### 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත

1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 4 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු 20 වන වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ (2) වන ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2008 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2008 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. කිසිදු තැනැත්තකු විසින් -

(අ) මේ නියෝගවල දක්වා ඇති උපලේඛනයේ විශේෂිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය;

හෝ

(ආ) මේ නියෝගවල දක්වා ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ද්‍රව්‍ය අඩංගු වන අයිතම හෝ භාණ්ඩ කිසිවක්,

1969 අංක1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ ආනයන සහ අපනයන පාලකවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයකට අනුකූලව ,හැර අන්‍යාකාරයකින් එකී උපලේඛනයේ අනුරූප සටහනේ නිශ්චිතව සඳහන් කර ඇති යම් දිනයක සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම නොකල යුතු ය.

3. යම් ආනයනය හෝ අපනයනය කිරීමක් "අත්‍යවශ්‍ය භාවිතයන් " හෝ "තීරණාත්මක භාවිතයන් "සඳහා අරමුණු කරගෙන කරන බව දැක්වීමට ප්‍රමාණවත් සාධක ඉදිරිපත් කිරීමට බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන තැනැත්තාට හැකි වී ඇත්නම් මිස, එකී නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවස්ථාවෝචිත පරිදි ද්‍රව්‍ය හෝ ද්‍රව්‍යවල අඩංගු අයිතම හෝ භාණ්ඩ සම්බන්ධයෙන් ආනයන හෝ අපනයන සඳහා වූ කිසිදු බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

1A - G 010415 — 1080 (2008/11)

4. මේ නියෝගවල කාර්යයන් සඳහා, -

"“තීරණාත්මක භාවිතයන්” යන්නෙන් - යම් ද්‍රවයක භාවිතයක් නිශ්චිත වන සහ එම ද්‍රව්‍යය ලබැගැනීමට පවත්නා හිඟකමෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳපළේ සැලකිය යුතු බිඳවැටීමක් සිදුවීමට පවත්නා අවකාශය නිසා තීරණාත්මක බවට පත්වන්නා වූ ද පාරිසරික හෝ සෞඛ්‍යමය දෘෂ්ටි කෝණයෙන් බැලීමේ දී පිළිගත හැකි වන්නා වූ ද තාක්ෂණික වශයෙන් සාධනීය විකල්පයක් හෝ භාවිතය සඳහා ලබාංගතහැකි ද්‍රව්‍ය නොමැත්තාවූ ද අවස්ථාවක භාවිත කරන්නාට ලබාගත හැකිවන ද්‍රව්‍ය භාවිතය අදහස් වේ.

"“අත්‍යවශ්‍ය භාවිතයන්” යන්නෙන් - සෞඛ්‍ය හෝ සුරක්ෂිතතාව සඳහා අත්‍යවශ්‍ය වන සහ සංස්කෘතිමය සහ බුද්ධිමය අවශ්‍යතා ඇතුළුව සමාජයේ ක්‍රියාකාරීත්වය සඳහා තීරණාත්මක බවට පත්වන්නා වූ ද පාරිසරික හෝ සෞඛ්‍යමය දෘෂ්ටි කෝණයෙන් බැලීමේ දී පිළිගත හැකි වන්නා වූ ද තාක්ෂණික සහ ආර්ථික වශයෙන් සාධනීය විකල්පයක් හෝ භාවිතය සඳහා ලබාගතහැකි ද්‍රව්‍ය නොමැත්තාවූ ද අවස්ථාවක භාවිතා කරන්නාට ලබාගත හැකිවන ද්‍රව්‍ය භාවිතය අදහස් වේ.

### උපලේඛනය

### ද්‍රව්‍ය

1. පිරිසිදු ක්ලෝරෝෆ්ලෝරෝකාබන් - (2009.01.01) සිට බලපැවැත්වේ).
2. පිරිසිදු බ්‍රෝමෝෆ්ලෝරෝකාබන් - (2010.01.01 සිට බලපැවැත් වේ.)

11-452

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.